මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# ජාතික රක්ෂණ භාර අරමුදල

# රැකියා පුරප්පාඩු

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, අග්‍රහාර වෛද්‍ය රක්ෂණ, මෝටර් රථ රක්ෂණය වැනි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර, දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. මෙම අරමුදල් මණ්ඩලය වසර 19ක් වැනි කෙටි කාලයක් තුළදී නවෝත්කරණය, වර්ධනය හා ලාභදායීත්වය සැළකීමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩුව සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**කළමනාකරු - පරිපාලන හා මෙහෙයුම් (HM 1-2)**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළගනු ලබන විශ්වවිද්‍යාලයකින් මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, රාජ්‍ය පරිපාලන, රාජ්‍ය කළමනාකරණ, වාණිජ්‍යය හෝ අදාල විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

**සමග**

අදාල ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම. (Associate Membership)

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 13ක සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් : (1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් ලබා තිබීම.
2. අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03ක කළමනාකරණ ගණයේ (I) ශ්‍රේණියේ (MM) සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම සහ එහි දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී තිබීම.

**වැටුප් පරිමාණය** : HM 1-2 - 2025 : රු.[143,120- 15X4,100-204,620]

:කළමනාකරණ සේවා චක්‍රලේඛ : 2026/01/01 සිට රු.125,113.00 සහ 2027/01/01 සිට රු.143,120.00)

❖ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද තිබීම අමතර සුදුසුකමකි.

**අනෙකුත් දීමනා** :

- ප්‍රවාහන දීමනාව (රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2015 (i) අනුව)
- ඉන්ධන දීමනාව (රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2015 (ii) අනුව)
- වෘත්තීය දීමනාව (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025අනුව)
- වෛද්‍ය රක්ෂණාවරණය

**වයස :** අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම් :** මෙම පත්වීම් ස්ථිර පත්වීම් වේ. සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

සියලුම අයදුම්කරුවන්,

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු අතර, දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමේ හැකියාව පැවතිය යුතුය.
- යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

**අයදුම්කරුවන්,**

- ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පතක්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමග එවිය යුතු වේ. දැනටමත් රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත එවිය යුතු වේ.
- අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කළ යුතුය.
- ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල, නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට **2026.03.11** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික රක්ෂණ භාර අරමුදල,**
**නො : 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත,**
**කොළඹ 02.**